**#mediaethicsSL #TamilPress #lka #Thinakkural #November28**

ලිංගික අපරාධයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පුවත්පතක් සැමවිටම දැඩි ලෙස ප්‍රවේසම්කාරී විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් ආචාර ධර්මයන් ඇත්තේද එනිසාවෙනි. ලිංගික අපරාධයකට ලක්වූවෙකුගේ අනන්‍යතාවය හෙළිදරව්‍ නොකළ යුතුය යන්න ඉන් එකකි. ලිංගික අපරාධයක් වාර්තා කරනා විට වින්දිතයා සහ සැකකරු/අපරාධකරු අතර ඥාති සම්බන්ධතාවය (එසේ තිබෙනා විටකදී) සඳහන් කරනා අතරතුරදීම සැකකරුගේ/අපරාධකරුගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීම ඔස්සේ ලිංගික අපරාධයේ වින්දිතයාගේ අනන්‍යතාවයද හෙළිදරව් වීමේ අවදානමක් ඇති බව බැහැර කළ නොහැක. එසේම පොදුවේ ගත් විට තවමත් නීතියෙන් වරදකරුවෙකු නොවූ සැකකරුවෙකුගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීම කෙතරම් ආචාර ධාර්මිකද යන කරුණද සාකච්ඡාවට බඳුන් වී තිබේ.

තිනකුරල් පුවත්පතේ පළවූ 13 හැවිරිදි දැරියක ලිංගිකව අපයෝජනයට බඳුන් කිරීමේ වාර්තාව මේ සඳහා උදාහරණයක් ලෙසින් ගත හැක. මෙහි බාලවයස්කාර වින්දිතයා සහ සැකකරු අතර ඥාති සම්බන්ධතාවය සඳහන් කර තිබෙනා අතර, සැකකරුගේ අනන්‍යතාවයද හෙළිදරව් කොට ඇත. මෙය සිදු නොවිය යුතු, මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීමක් ලෙසින් පෙන්වා දීමට සිදුවේ.